සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්‍ෂණය 2016
## 10 ශ්‍රේණිය ඉතිහාසය - I කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමිවේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව විශ්වසනීය ලෙස අඛණ්ඩව ලියවී ඇති මූලාශ්‍ර ග්‍රන්ථය මින් කවරක් ද?
(1) දීපවංසය (2) බෝධිවංසය (3) මහාවංසය (4) ධාතුවංසය

02. මහාවංසය අර්ථ විවරණය සඳහා සම්පාදනය කළ ටීකාව කුමක් ද?
(1) චූලවංසය (2) සමන්තපාසාදිකාව (3) පූජාවලිය (4) වංසත්ථප්පකාසිනී

03. පහත සඳහන් කතුවරු අතරින් ලංකාවට පැමිණ මෙහි තොරතුරු දැක බලා වාර්තා කළ අය වන්නේ මින් කවරෙක් ද?
A - පාහියන් හිමි B - ප්ලිනි C - හියුං සියැං හිමි D - රිබෙයිරෝ
(1) A, D (2) A, C (3) B, C (4) B, D

04. පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ භාවිතා වූ මෙරට ආර්ථිකය හා තාක්‍ෂණය හැදෑරීමට උදව් වන රනින් නිම කළ මෙම කාසිය හඳුන්වන්නේ කුමන නමකින් ද?



(1) කහාපණ
(2) මධ්‍යකාලීන රන් කහවණු
(3) ඇතා සහ ස්වස්තික කාසි
(4) අක

05. මෙරට ගල් යුගයට අයත් මෙවලම් හමු වූ අර්ධ ශුෂ්ක කලාපයේ පොළවේ මැටි සහිත වැලි පසකින් වැසුණු බොරලු තට්ටුව හැඳින්වූයේ මින් කවර නමකින් ද?
(1) ඉරණමඩු සැකැස්ම (2) කුම්භීය නිඛනන (3) නවනීත (4) පීඩන ශල්කනය

06. මිනිහාගල්කන්ද, බූන්දල, පතිරාජවෙල යන ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන අයත් වන්නේ මින් කවරකටද?
(1) පහත රට වියළි කලාපීය එළිමහන් කඳවුරු. (2) කඳුකර එළිමහන් දඩයම් ස්ථාන.
(3) පහතරට වියළි කලාපීය ලෙන්. (4) වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරු.

07. පහත I තීරුවෙන් ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු කීපයක් දක්වෙන අතර II තීරුවෙන් ඒ හා සම්බන්ධ තවත් තොරතුරු දක්වේ. ඒවා නිවැරදිව යා කළ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ප්‍රාග් ඓතිහාසික යුගය හා ඓතිහාසික යුගය අතර ඇති යුගය. | A - ගල් යුගයේ ජීවත් වූ මිනිස්සු. |
| 2. වර්තමාන වැදි ජනයා හා සංස්කෘතමය හා ජීව විද්‍යාත්මක සමානතා ඇති මිනිස්සු. | B - පූර්ව ඓතිහාසික යුගය. |
| 3. ගල් යුගයේ තාක්‍ෂණය පිළිබඳ දැනුමක් ලබාගත හැකි දේවල්. | C - මිනී වැළලීම් සම්බන්ධයෙන්. |
| 4. ගල් යුගයේ අභිචාර විධි ගැන තොරතුරු ලැබේ. | D - ජ්‍යාමිතික ක්‍ෂුද්‍ර ශිලා මෙවලම්. |

(1) BDAC (2) BCAD (3) BADC (4) BACD


08. දඩයම් යුගය අවසානයේ ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනගාගත් බවට පැහැදිලි නිවාස අවශේෂ සොයා ගෙන ඇති ගම්මානය වන්නේ මින් කුමක් ද?
(1) ඉබ්බන්කටුව (2) උඩරංචාමඩම (3) පාහියන්ගල (4) සීගිරියේ පොතාන

09. ගල් යුගයේ මිනිසා මිටි හා ඇඹරුම් ගල් සකස් කර ගැනීමට භාවිතා කළ පාෂාණ වර්ගය වන්නේ කුමක් ද?
(1) තිරුවානා ගල් (2) කහඳගල් (3) කළුගල් (4) ගුරුගල්

10. පහත I තීරුවේ දක්වෙන පුරාණ ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු සඳහා යොදන ලද හැඳින්වීම් II තීරුවේ නාම හා ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
| --- | --- |
| 1. ගම් ප්‍රධානීන් දස දෙනෙකුගෙන් යුත් මණ්ඩලය හැඳින්වූ නාමය. | A - අමුණ |
| 2. ක්‍රි.ව. 6 වන සියවසේ දී පමණ මෙරට පැවති වැටකින් ආරක්ෂා වූ ගම් හැඳින් වූ නාමය. | B - නුරුපුර |
| 3. ගනේකන්ද හා ගල්ලෙන විහාරයේ යොදාඇති බ්‍රාහ්මීය සෙල්ලිපිවල 'අවරණ' වචනයේ අර්ථය. | C - පරික්ඛිත්ත |
| 4. පළමුවන විජයබාහු රජතුමාගේ පනාකඩුව තඹ සන්නසේ අනුරාධපුර නම් කර ඇති පදය. | D - දසගම් ඇත්තන් |

(1) DCAB (2) DACB (3) ABCD (4) CABD



11. පින්තූරයේ දැක්වෙන මෙම පබළු මාලය හමු වී ඇති ස්ථානය වන්නේ මින් කුමක් ද?
(1) පාහියන්ගල ලෙන (2) ඉබ්බන්කටුව සුසාන භූමිය
(3) කඨදිය පොකුණ විහාරය (4) සීගිරි පර්වතය

12. ඓතිහාසික මූලාශ්‍රවලට අනුව රාජ්‍යත්වය වර්ධනය වූ පසු මෙරට පාලනය කළ ප්‍රථම රජු ලෙස සලකන්නේ මින් කවර රජු ද?
(1) විජය රජු (2) දේවානම්පියතිස්ස රජු
(3) පණ්ඩුකාභය රජු (4) දුටුගැමුණු රජු

13. පුරාණ ශ්‍රී ලංකාවේ පාලන බලය මුල් මට්ටමේ සිට රාජ්‍යත්වය දක්වා විකාශනය වූ අනුපිළිවෙල දැක්වෙන්නේ කවර පිළිතුරේ ද?
(1) ගෘහපති, මපුරුමුකා, ගමික, පරුමක (2) මපුරුමුකා, පරුමක, ගෘහපති, ගමික
(3) ගෘහපති, ගමික, පරුමක, මපුරුමුකා (4) පරුමක, ගෘහපති, ගමික, මපුරුමුකා

14. වසභ රාජ්‍ය සමය ගැන සලකා පහත සඳහන් වන ක්‍රියාමාර්ග අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙරට පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීම හා විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම.
(2) පොදු අරමුණක් වෙනුවෙන් කටයුතු කිරීම හා සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක යෙදීම.
(3) සැලසුම් සහගතව යුධ සංග්‍රාමයේ යෙදීම හා භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම.
(4) රටේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම හා දේශපාලන බලය වඩාත් ශක්තිමත් කිරීම.

15. විමධ්‍යගතව පැවති මෙරට දේශපාලනය මධ්‍යගත කිරීමේ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ මින් කුමන රජු ද?
(1) පණ්ඩුකාභය රජු (2) පළමුවන විජයබාහු රජු
(3) වසභ රජු (4) දුටුගැමුණු රජු

16. නාගදීපය පාලනය කළ සාකිගිරි ඇමතියා විසින් ඉදිකළ විහාරය මින් කුමක්ද?
(1) ඇත් වෙහෙර (2) නාගදීප විහාරය (3) කදුරුගොඩ විහාරය (4) පියංගුකතිස්ස විහාරය

17. දේවානම්පියතිස්ස රජුගෙන් පසු පිළිවෙලින් බලයට පත් රාජ නාමාවලිය අඩංගු වන්නේ කවර පිළිතුරේ ද?
(1) උත්තිය, මහාසිව, සූරතිස්ස, අසේල (2) උත්තිය, අසේල, මහාසිව, සූරතිස්ස
(3) උත්තිය, මහාසිව, අසේල, සූරතිස්ස (4) අසේල, සූරතිස්ස, මහාසිව, උත්තිය

18. පහත සඳහන් ප්‍රකාශ අතරින් වෙළඳ මධ්‍යස්ථාන පිළිබඳව සඳහන් වන ප්‍රකාශ තෝරන්න.
A සීගිරියේ බටහිර ජල උද්‍යානයේ සෙල්ලිපියක 'වාපර' නමින් සියඹලා වෙළෙන්දෙකු හඳුන්වා ඇත.
B එකල පැවති සමූහ වෙළඳ සංවිධාන 'පූගය' හෙවත් 'නියමස්ථාන' නමින් හඳුන්වා ඇත.
C සොරබොර වැව ටැම් ලිපියේ හෝපිටිගම වෙළඳපොළ විස්තර කර ඇත.
D නානාදේසි වෙළඳ සංවිධානයට අයත් මුද්‍රාවක් අනුරාධපුරයෙන් සොයාගෙන ඇත.
(1) A හා B (2) B හා D (3) B හා C (4) C හා D

19. අතීතයේ විවිධ වෘත්තීන් වල නියැලුන අය පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දක්වේ. ඒවායින් නිවැරදි ප්‍රකාශය තොරන්න.
A සිත්තරුන් සදිව්හරිය නමින් හඳුන්වා ඇත.
B නිති විශාරදයෝ 'වොහාර' ලෙස හඳුන්වා ඇත.
C ගුරුවරුන් භාණකවරු නමින් හඳුන්වා ඇත.
D සෙල්ලිපි වල වෛද්‍යවරු 'වෙජ' නමින් හඳුන්වා ඇත.
(1) A හා B (2) B හා D (3) B හා C (4) C හා D

20. පැරණි සමාජයේ ජල කලමණාකරණය සඳහා යොමු වීමට බලපෑ හේතු සඳහන් වන්නේ කවර පිළිතුරේ ද?
A ගොවිතැන් කටයුතු සඳහා ජලය අවශ්‍ය වීම.
B මිරිදිය මසුන් ඇතිකිරීමට ජලය අවශ්‍ය වීම.
C තමාගේ එදිනෙදා ජීවන අවශ්‍යතාවලට ජලය අවශ්‍ය වීම.
D නගර අලංකරණයට ජලය අවශ්‍ය වීම.
(1) A හා D (2) B හා D (3) B හා C (4) A හා C

- පහත දක්වා ඇති රජවරු පිළිබඳව අධ්‍යයනය කර 21 සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A තුන්වන විජයබාහු රජතුමා
  B හයවන පරාක්‍රමබාහු රජතුමා
  C දෙවන පරාක්‍රමබාහු රජතුමා
  D දෙවන බුවනෙකබාහු රජතුමා
  E තුන්වන බුවනෙකබාහු රජතුමා


21. ඉහත දක්වා ඇති රජවරු අතරින් කුරුණෑගල රාජධානිය කරගත් රජවරු ඇතුළත් පිළිතුර වන්නේ,

(1) B හා D　(2) D හා E　(3) C හා D　(4) A හා C

22. ඉහත දැක්වෙන රජවරු අතරින් සාහිත්‍ය කටයුතු සඳහා අනුග්‍රහය දැක් වූ රජවරු දෙදෙනෙකු අයත් පිළිතුර තෝරන්න.

(1) A හා D　(2) B හා A　(3) B හා D　(4) B හා C

- අංක 23 - 24 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදා ගන්න.




23. දළදා සිරිත හා සද්ධර්මාලංකාරය කෘති ලියවී ඇති රාජධානි දක්වන අක්ෂර මොනවා ද?

(1) C හා D　(2) B හා D
(3) D හා E　(4) D හා F

24. චන්ද්‍රබානුගේ ආක්‍රමණ හා විජයබා කොල්ලය සිදු වූ රාජධානි දැක්වෙන අක්ෂර පිළිවෙලින් සඳහන් වන පිළිතුර තෝරන්න.

(1) C හා F　(2) B හා E
(3) C හා D　(4) A හා B

- පහත සඳහන් වගුවේ A සිට I දක්වා තොරතුරු ඇසුරෙන් 25, 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | රජවරු | සිදුවීම |
|---|---|---|
| A 1594<br>B 1638<br>C 1815 | D දෙවන රාජසිංහ රජු<br>E ශ්‍රී වික්‍රම රාජසිංහ රජු<br>F පළමුවන විමලධර්මසූරිය රජු | G වෙල්ලෝරයට පිටුවහල් කිරීම<br>H දන්තුරේ සටන<br>I ගන්නොරුව සටන |

25. උඩරට රාජධානිය යටත්වීම සම්බන්ධ සිදුවීම් අඩංගු පිළිතුර මින් කුමක් ද?

(1) C E G　(2) C D I　(3) C F H　(4) B E G

26. උඩරට රාජධානිය ආක්‍රමණය සඳහා පෘතුගීසින් මෙහෙය වූ ප්‍රථම සටන සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද?

(1) B F H　(2) A F H　(3) C D I　(4) C E H

- පහත වගුව ඇසුරෙන් 27 - 28 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ශිල්පීන් | නිර්මාණය | කලාව |
|---|---|---|
| A මයිකල් ඇන්ජලෝ<br>B ලියනාඩෝ ඩාවින්චි<br>C රෆායල් | D පියෙටා රුව<br>E ශාන්ත පීතර බැසිලිකා දේවස්ථානය<br>F අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය | G චිත්‍ර කලාව<br>H ප්‍රතිමා කලාව<br>I ගෘහ නිර්මාණ කලාව |

27. ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ තොරතුරු ඇතුලත් පිළිතුර,

(1) A D I　(2) B E I　(3) A E I　(4) B F I

28. කලාවට මෙන්ම ඉංජිනේරු ක්ෂේත්‍රයට ප්‍රවීණත්වයක් දැක් වූ පුද්ගලයාගේ නිර්මාණවලට අදාළ තොරතුරු ඇතුළත් පිළිතුර මින් කවරක් ද?

(1) A D I　(2) B E G　(3) B F G　(4) A F G

- මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණ කීපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් 29 හා 30 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A දීග විවාහ, බින්න විවාහ හා එකගෙයි කෑම යනුවෙන් විවාහ ක්‍රම තුනකි.
  B යකඩ, දැව, ලෝහ හා ලාක්ෂා කර්මාන්තය ද පන් කර්මාන්තය ද දියුණුව පැවතුණි.
  C රටේ ඉහළම බලය හිමි තැනැත්තා රජු විය.
  D සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත පදනම් විය.
  E කඳුකර ප්‍රදේශ බහුල වූ බැවින් වී ගොවිතැන කළ හැකි ප්‍රදේශ සීමිත විය.

29. ඉහත ලක්ෂණවලින් උඩරට සමාජ සංවිධානය පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රකාශ මොනවා ද?

(1) A හා B (2) C හා D (3) A හා C (4) A හා D

30. ඉහත ප්‍රකාශ ඇසුරෙන් ආර්ථික ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන තොරතුරු ඇතුළත් ප්‍රකාශන දක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) B හා E (3) B හා C (4) C හා D

- **අංක 31, 32 හා 33 ප්‍රශ්නවලට හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරා එයට හිමි අංකය පිළිතුරු පත්‍රයේ ලකුණු කරන්න.**

31. 1505 දී ලංකාවට පැමිණි පෘතුගීසි කණ්ඩායමේ නායකයා ........................................................ ය.

(1) ප්‍රැන්සිස්කු ද අල්මේ දා (2) දියෝගෝ ද මෙලෝ කුැස්තෝ
(3) පේරෝ ලෝපේස් ද සූසා (4) ලොරෙන්සෝ ද අල්මේදා

32. 1764 දී උඩරට ආක්‍රමණය ............................................ ආණ්ඩුකාරයා මෙහෙයවීය.

(1) ෆන් එංගල් බෙක් (2) බැරන් වැන් එක්
(3) ජොරිස් වැන් ස්පිල්බර්ජන් (4) ජෙරනිමෝද අසවේදු

33. 1630 කොන්ස්තන්තීනු ද සා .......................................... මෙහෙයවීමය.

(1) රන්දෙනිවල සටන (2) බලන සටන (3) ගන්නෝරුව සටන (4) දන්තුරේ සටන

- **පහත A, B, C හා D යටතේ දැක්වෙන ප්‍රකාශ යුගලයන් අධ්‍යයනය කර 34, 35 හා 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
| A | 1. උතුරු තරු මාපකය නිපදවීම | 2. | ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම. |
| B | 1. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත් වීම. | 2. | පුනරුදය. |
| C | 1. ග්‍රීක, ලතින් භාෂා ඉගෙනීම විලාසිතාවක් බවට පත්වීම. | 2. | සාහිත්‍යයේ නව ප්‍රබෝධයක් ඇතිවීම. |
| D | 1. මාලිමා යන්ත්‍රය නිපදවීම. | 2. | දේශ ගවේෂණය. |

34. පළමුවැන්නේ වර්ධනය දෙවැන්න සාර්ථක වීමට බලපාන යුගල දෙක වන්නේ,

(1) A හා D වේ. (2) B හා D වේ. (3) C හා A වේ. (4) D හා B වේ.

35. දෙවැන්නේ ක්‍රියාකාරීත්වයට පළමුවැන්න අත්‍යාවශ්‍ය වන යුගල දෙක වන්නේ,

(1) A හා B වේ. (2) C හා D වේ. (3) C හා A වේ. (4) D හා B වේ.

36. දෙවැන්නේ ක්‍රියාකාරීත්වයට පළමුවැන්න අත්‍යාවශ්‍ය නොවන යුගලය වන්නේ,

(1) A වේ. (2) B වේ. (3) C වේ. (4) D වේ.

- ඒ ඒ ප්‍රශ්නවලට අදාළව A හා B ප්‍රකාශ කියවා 37, 38, 39, 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

37. A විජයබා කොල්ලය
B කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදීම.

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

38. A හත්වන බුවෙනෙකබාහු රජුගේ මරණින් පසුව ධර්මපාල කුමරු කෝට්ටේ පාලකයා විය.
B ධර්මපාල කුමරු දොන් පිලිප් නමින් බෞතීස්ම ලැබීය.

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

39. A දේශ ගවේෂණය සඳහා මුලින්ම උනන්දු වූ රට බ්‍රිතාන්‍ය වේ.
B දේශ ගවේෂණ කටයුතු සඳහා හෙන්රි කුමරු අනුග්‍රහය දැක්වීය.

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

40. A 1766 දී ලන්දේසීන් සාම ගිවිසුමට අත්සන් කළේ දෙවන රාජසිංහ රජු සමගය.
B 1658 වන විට පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා හරින්නට හැකිවිය.

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය **ඉතිහාසය - II** කාලය පැය 03 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- දෙවන කොටසින් ප්‍රශ්න හතරකට ද, තෙවන කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## පළමුවන කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

i. මැණික් ගඟ, ඉරණමඩු වැව, උඩරංඩාමඩම, මිහිගල්කන්ද, මහනුවර, යාපහුව, ජම්බුකෝලපට්ටන, පල්ලවංක, ගල්ඔය, අරුවි ආරු, කාලතිත්ථ, අලිගල (ල.13)

ii. ඉතාලිය, මධ්‍යධරණී මුහුද, කැලිකට් වරාය, සූවස් ඇළ, පිලිපීන දූපත්, කොන්ස්තන්තිනෝපලය (ල.05)

(ආ) i. පහත A, B, C හා D යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබූ රජතුමා.

B ගම්පොල රාජ්‍ය සමයේ දී මෙරට ආක්‍රමණය කළ චීන සේනාධිපතියා.

C පෘථිවිය ගෝලාකාර බවත් අනෙකුත් ග්‍රහයන් සූර්යයා වටේ පරිභ්‍රමණය වන බවත් සොයාගත් විද්‍යාඥයා.

D ඉන්දියාවේ කැලිකට් වරායට ළඟා වූ පෘතුගීසි ජාතිකයා. (ල.04)


- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



ii. 1. 'A' වලින් දැක්වෙන රූපයට අදාළ ස්ථානය කුමක් ද?
2. මෙය අයත්වන සොහොන් විශේෂය කුමක් ද?
3. මෙම ස්ථානය අයත්වන්නේ කුමන පළාතට ද?
4. මේවා කවුරුන් සඳහා භාවිතා කර තිබේ ද? (ල.04)

B



iii. 1. 'B' වලින් දැක්වෙන චිත්‍රය නිර්මාණය කළ චිත්‍ර ශිල්පියා කවුද?
2. මෙම චිත්‍රය දක්නට ලැබෙන්නේ කුමන ස්ථානයේ ද?
3. එම ස්ථානය පිහිටා ඇති නගරය කුමක් ද?
4. මෙම චිත්‍රය අයත්වන යුගය කුමක් ද? (ල.04)

## දෙවන කොටස

(02) i. පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුව පහත සඳහන් අභිලේඛන ලියා ඇති මාධ්‍ය සඳහා නිදසුන් එක බැගින් දක්වන්න. (ල.03)

A තඹ තහඩු

B රන් තහඩු

C දැව

ii. පහත සඳහන් විදේශීය මූලාශ්‍ර ලියූ කතෘවරු නම් කරන්න. (ල.04)

A ඩිමුණ්ඩෝ

B නැචුරාලිස් හිස්ටෝරියා

C ඉන්ඩිකා

D භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය

iii. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස කාසිවල ඇති වැදගත්කම කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

iv. ඉතිහාසය හැදෑරීමේ දී නටඹුන්වල ඇති වැදගත්කම කරුණු 03 ක් යටතේ උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.06)

(03) i. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් 03 ක් නම් කරන්න. (ල.03)

ii. මුල් ඓතිහාසික යුගයේ සෙල්ලිපිවල සඳහන් වෘත්තිකයින් විසූ ජනාවාස A, B, C, D පිළිවෙලින් දක්වන්න. (ල.04)

A. ධීවරයන් විසූ ගම්

B. වඩුවන් විසූ ගම්

C. ගොවියන් විසූ ගම්

D. වළං සාදන්නන් විසූ ගම්

iii. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක 02 ක් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යුහය හා ස්වරූපය පිළිබඳව කරුණු 03 ක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.06)

(04) i. සෙල්ලිපිවල පහත සඳහන් වචනවලින් ප්‍රකාශ වූ අදහස දක්වන්න.

A. තොට භොජක

B. එක්තැන්සමිය

C. පොවනි රජ (ල. 03)

ii. ලංකාවේ දේශපාලන බලය මධ්‍යගතව පැවති අවධියේ පහත රාජ්‍ය නිලධාරීන් පිළිවෙලින් නම් කරන්න.

| | |
|---|---|
| 1. බතගු | 2. පත අදෙක |
| 3. නට අදෙක | 4. නගර වුඩික |

(ල.04)

iii. වසභ රජතුමා දේශපාලනික වශයෙන් වැදගත් වීමට බපෑ හේතු 02 ක් විස්තර කරන්න. (ල.05)

iv. පැරණි ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු සිදුවූ ආකාරය සත්ව පාලනය හා වී ගොවිතැන ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.06)

(05) i. මෙම රූපය ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



A. මෙම පින්තූරයෙන් පෙන්නුම් කෙරෙන්නේ කුමක් ද?

B. මෙය හමුවී ඇත්තේ කුමන ස්ථානයකින් ද?

C. මෙම නිර්මාණයෙන් අපේ කවර පැරණි තාක්ෂණික අංගයක් හෙළිවේ ද? (ල.03)

ii. පොළොන්නරු රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු 04 ක් දක්වන්න. (ල.04)

iii. දෙවන නාගරීකරණ සමයේ ආර්ථික රටාව සකස් වූ ආකාරය කරුණු 02 ක් යටතේ සාකච්ඡා කරන්න. (ල.05)

iv. හයවන පරාක්‍රමබාහු රජතුමාගේ කාර්ය සංසිද්ධි උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.06)

(06) i. A. මෙම පින්තූරයෙන් දැක්වෙන සිතුවම කුමන රජතුමාගේ යැයි සැලකේ ද?

B. එම රජතුමා පාලනය කළ රාජධානිය කුමක් ද?

C. මෙම චිත්‍රය සිත්තම් කර ඇත්තේ කවුද? (ල.03)



ii. මහනුවර රාජධානිය පාලනය කළ නායක්කාර් වංශික රජවරු පිළිවෙලින් දක්වන්න. (ල.04)

iii. මහනුවර රාජධානියේ ප්‍රාදේශීය පාලනය බෙදී තිබුනු ප්‍රධාන කොටස් දෙක නම්කර එහි පරිපාලන කටයුතු සිදුවූ ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.05)

iv. පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ කාර්ය සංසිද්ධිය දේශපාලනික, ආගමික හා ආර්ථික වශයෙන් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.06)


(07) i. පහත A, B, C වලින් දැක්වෙන ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ල.03)

A. පෘතුගීසින්ගේ රූකඩයක් බවට පත් වූ කෝට්ටේ පාලකයා.

B. 'කිව් ලිපිය' අනුව ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් ඉංග්‍රීසීන්ට ලබා දීමට අකමැති වූ ලන්දේසි ආණ්ඩුකාර වරයා,

C. ක්‍රි.ව. 1815 උඩරට ගිවිසුමට අත්සන් කළ බ්‍රිතාන්‍යය ආණ්ඩුකාර වරයා,

(ජෝන් ඩොයිලි, රොබට් බ්‍රවුන්රිග්, වීදිය බණ්ඩාර, දොන් ජුවන් ධර්මපාල, සංකිලි, ෆන් එංගල්බෙක්, රයික්ලොක් ෆන් හූන්ස්)




ii. පහත සඳහන් සටන් ඇති වූ ස්ථාන යාබද සිතියම අධ්‍යයනය කර 1, 2, 3, 4 සටන් සිදුවූ ස්ථාන ලියා පිළිවලින් අදාළ අක්ෂරය දක්වන්න.

1. දන්තුරේ සටන   2. බලන සටන

3. රන්දෙනිවල සටන   4. ගන්නෝරුව සටන (ල.04)

iii. 1638 උඩරට ලන්දේසි ගිවිසුම ඇති වූයේ කුමන රජු යටතේ ද දක්වා එහි සඳහන් මූලික ලක්ෂණ 04 ක් දක්වන්න. (ල.05)

iv. 1766 ලන්දේසි හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු අතර සාම ගිවිසුම අත්සන් කිරීමට පසුබිම නිර්මාණය වූ ආකාරය කරුණු 03 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

## තුන්වන කොටස

(08) i. පහත සඳහන් සිද්ධීන්ට අදාල පුද්ගලයින් වරහන් තුළින් තෝරා පිළිවෙලින් සඳහන් කරන්න.

1. අත්හදා බැලීමේ පියා ලෙස සැලකෙන්නේ කවරෙක් ද?

2. මුද්‍රණ යන්ත්‍රය නිපදවූයේ කවුද?

3. සුභ පැතීමේ තුඩුව හෙවත් කුණාටු තුඩුව සොයාගනු ලැබුවේ කවුරුන් ද?

(රෆායල් සැන්ඩි, ජොහැන්නස් කෙප්ලර්, වස්කෝද ගාමා, ජොහැන්නස් ගුටෙන්බර්ග්, බර්තොලමියු ඩයස්, කැබේ සහෝදරයෝ) (ල.03)

ii. පහත සඳහන් නිර්මාණ බිහිකළ ශිල්පීන් නම් කරන්න. (ල.04)

A. ඩිවිනා කොමඩියා කාව්‍ය ග්‍රන්ථය කාගේ නිර්මාණයක් ද?

B. ආදම්ගේ චිත්‍රය සිතුවම් කළේ කවුද?

C. ලෝරාට සැහැලි කවි ග්‍රන්ථයේ රචකයා කවුද?

D. මොනාලිසා චිත්‍රය නිර්මාණය කළේ කවුද?

iii. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු 02 ක් විස්තර කරන්න. (ල.05)

iv. යුරෝපා ජාතීන් නව මුහුදු මාර්ග සොයා යාම සඳහා පෙළඹවීමට බලපෑ ප්‍රධාන හේතුව දක්වා එය සාර්ථක කර ගැනීමට යුරෝපයේ පැවති පසුබිම පිළිබඳව කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

(09) i. පහත සඳහන් සොයාගැනීම් කළ පුද්ගලයන් වරහන් තුළින් තෝරා පිළිවෙලින් නම් කරන්න. (ල.03)

1. බටහිර ඉන්දීය දූපත් 2. ඇමරිකාව 3. පිලිපීනය

(බර්තොලමියු ඩයස්, ඇමරිගෝ වෙස්පුචි, වස්කෝ ද ගාමා, පර්ඩිනන්ඩ් මැගලන්, ක්‍රිස්ටෝපර් කොළොම්බස්)

ii. යාබද සිතියමේ දක්වා ඇති ස්ථාන පහත සඳහන් සිදුවීම් හා ගලපා නිවැරදි අක්ෂර 1, 2, 3, 4 පිළිවෙලින් දක්වන්න. (ල.04)




1. යුරෝපීයන්ට පෙර අපර දෙදිග වෙළඳාමේ දී වැදගත් මධ්‍යස්ථානයක් වූ තුර්කීන් අතට පත් වූ වෙළඳ නගරය.

2. දේශ ගවේෂණයට විශාල අනුග්‍රහයක් ලබාදුන් හෙන්රි රජතුමාගේ රාජ්‍ය.

3. පුනරුද සමයේ ඉතා පුළුල් වෙනසකට ලක් වූ චිත්‍ර කලාව බිහි කළ ප්‍රධාන මධ්‍යස්ථානය වූ ප්ලොරන්ස් නගරය පිහිටි රට.

4. ගුරුත්වාකර්ෂණ නියමය සොයාගත් අයිසෙක් නිව්ටන්ගේ මව් බිම.

iii. යුරෝපා රටවල භාෂාව හා සාහිත්‍යයේ ප්‍රබෝධය ඇතිකිරීම සම්බන්ධයෙන් පුනරුදය බලපෑ ආකාරය කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

iv. යුරෝපයේ ඇති වූ පුනරුදය ලංකාවේ ආර්ථික හා සමාජ වෙනස්කම් කෙරෙහි බලපෑ ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.06)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(1) | 4 -(2) | 5 -(1) | 6 -(4) | 7 -(3) | 8 -(2) | 9 -(3) | 10 -(1) |
| 11-(2) | 12-(3) | 13-(3) | 14-(1) | 15-(4) | 16-(4) | 17-(1) | 18-(3) | 19-(2) | 20-(4) |
| 21-(2) | 22-(4) | 23-(2) | 24-(1) | 25-(1) | 26-(2) | 27-(3) | 28-(3) | 29-(4) | 30-(2) |
| 31-(4) | 32-(2) | 33-(1) | 34-(1) | 35-(2) | 36-(1) | 37-(3) | 38-(1) | 39-(2) | 40-(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) i. සිතියමේ දක්වා ඇත. (ලකුණු 13 + 5 = 18) (ආ) i. A. දෙවන පරාක්‍රමබාහු රජතුමා B. වෙන් හෝ සෙන්පතියා C. නිකලස් කොපර්නිකස් D. වස්කෝද ගාමා (ල.04) ii. (2) 1. ඉබ්බන්කටුව සුසාන භූමිය 2. ශිලා මංජුසා සොහොන් 3. මධ්‍යම පළාත 4. පරුමකයින් වැනි ප්‍රභූන් සඳහා (ල.04) iii. 1. මයිකල් ඇන්ජිඅලෝ 2. සිස්ටයින් දෙව්මැදුරේ 3. රෝමය 4. පුනරුද යුගය (ල.04)

(02) i. A. පළමුවන විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නස B. වල්ලිපුරම් රන්පත C. ඇම්බැක්කේ දේවාලයේ දැව කණුවල ලියූ ලේඛන (ල.03) ii. A. ඇරිස්ටෝටල් B. ප්ලිනි C. මෙගස්තිනීස් D. ටොලමි (ල.04) iii. රටේ ආර්ථික තත්ත්වය, වෙළඳාම, ලෝහ භාවිතය, රජුගේ බලව්‍යාප්තිය ආදී කරුණු ආශ්‍රිත විස්තර කිරීම් සඳහා (ලකුණු 05) iv. පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව, තාක්ෂණය, ගොඩනැගිලි නිර්මාණය හෙවත් වාස්තු විද්‍යාව, ශිල්පීය දක්ෂතාව, පරිසර සංරක්ෂණ හැකියාව, ජල පාලනය ආදී විවිධ අංශ පිළිබඳ නිරවුල් දැනුමක් ලබාගත හැකි බව සඳහන් වන තොරතුරු 03 කින් උදාහරණ සහිතව විස්තර කිරීම්. (ලකුණු 06)

(03) i. පාහියන්ගල ලෙන, බටදොඹ ලෙන, කිතුල්ගල බෙලි ලෙන (ල.03) ii. A. කේවට්ටගාම B. වඩ්ඪකීගාම C. කසීකාරගාම D. කුම්භකාරගාම (ල.04) iii. වාර්ෂික වර්ෂාපතනය, පසේ ස්වභාවය, භූ විෂමතාව ස්වභාවික සම්පත් වල ව්‍යාප්තිය, ජලවහනය ආදී කරුණු 02 ක් විස්තර කිරීමට ලකුණු දෙන්න. (පෙළ පොත 24 25 පිටු අංක) (ලකුණු 05) iv. වැවක් කේන්ද්‍රකරගෙන වර්ධනය වීම, විවිධ වෘත්තිකයන් අනුව හා කරන ලද කාර්යයන් අනුව ගම් නිර්මාණය වීම, ගමක විශාලත්වය හා පවුල් ප්‍රමාණ, ගමක් ආරක්ෂා වීම, වෙනත් ගමකින් වෙන්ව පිහිටීම, පරිපාලනය හා සංවිධානය ක්‍රමවත් වීම යන තුනක් ඇසුරින් උදාහරණ සහිත විස්තර කිරීම්. (ල.06)

(04) i. A. තීර්ථය අනුභව කරන්නා B. රාජ සභාවේ එකගතාව C. ප්‍රාදේශීය පාලක / ප්‍රාචීන රජ / නැගෙනහිර ප්‍රදේශයේ රජ (ල.03) ii. (1) භෝජනශාලා අධිකාරි (2) වෙළඳ කටයුතු භාර නිලධාරී (3) නාට්‍ය අංශයේ ප්‍රධානී (4) නාගරික වාස්තු විද්‍යාඥ (ල.04) iii. ● ලම්බකර්ණ වංශයේ ආරම්භකයා වීම. ● අභ්‍යන්තර පාලනය විධිමත් ලෙස සංවිධානය කිරීම. ● වාරි තාක්ෂණයට විශේෂ අනුග්‍රහය දැක්වීම (විශාල වැව් ඉදිකිරීමේ පුරෝගාමියා වීම.) ● බෞද්ධ වෙහෙර විහාර ඉදිකිරීම. ආදී තොරතුරු දෙකක් ඇතුලත්ව උදාහරණ සහිත විස්තර කිරීම්. (ල.05) iv. ● සත්ව පාලනය : ගවයන්, කුකුළන්, එළුවන් ඇති මෙම සහ කිරීම. සතුන්ගෙන් ලබාගත් ප්‍රයෝජන පිළිබඳ විස්තර කිරීම. ● වී ගොවිතැන : වී වගාවට ජලය ලබාගත් ආකාරය, වගා කළ කන්න, රාජ්‍ය අනුග්‍රහය ලබා දීම. ආදී විස්තර ඇතුලත්ව ලියා ඇති ප්‍රමාණාත්මක පිළිතුරු සැලකිල්ලට ගන්න. (ල.06)

(05) i. A. සොරොව්වක් B. මාදුරු ඔය ජලාශය පිහිටි ස්ථානය C. පැරණි වාරි තාක්ෂණයේ විශිෂ්ඨ බව (ල.03) ii. ● සතුරු ආක්‍රමණ / කාලිංගමාඝගේ ආක්‍රමණය ● මධ්‍යගත පාලනය බිඳවැටීම. ● වෙළඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම. ● ආරක්ෂාව නැතිවීම. ● ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම. (ල.04) iii. ● වැව් හා වාරිකර්මාන්ත ඉදි කිරීමට අවධානය යොමු නොවීම. ● ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මය වීම. ● ජලය හිඟ ප්‍රදේශවල හේන් ගොවිතැන. ● වාණිජ්‍ය ආර්ථිකයකට යොමු වීම. ● වෙළඳ භාණ්ඩ ආනයනය කිරීම (මුතු, මැණික්, ඇතුන්) ● චීනයෙන් පිඟන් භාණ්ඩ ආනයනය කිරීම. (ල.05) iv. ● වන්නි රාජ්‍ය කෝට්ටේ රාජ්‍යයට යටත් කිරීම. ● යාපනය ජය ගැනීම. ● ජොතිය සිටුවරයාගේ කැරැල්ල මැඩලීම. ● කෝට්ටේ රාජ්‍ය එක්සේසත් කිරීම. ● ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම. ● අධ්‍යාපනික හා සාහිත්‍ය කටයුතුවලට විශාල සේවයක් කිරීම. (ආදී විස්තර උදාහරණ ද සහිතව ඉදිරිපත් කරමින් ලියා තිබීම.) (ල.06)

(06) i. A. දෙවන රාජසිංහ රජු B. මහනුවර රාජධානිය C. රොබට් නොක්ස් (ල.03) ii. A. ශ්‍රී විජය රාජසිංහ රජු B. කීර්ති ශ්‍රී රාජසිංහ රජු C. රාජාධිරාජසිංහ රජු D. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ල.04) iii. ● රට ● දිසාව ★ <u>රටවල් 9 නම් කිරීම :</u> උඩුනුවර, යටිනුවර, තුම්පනේ හාරිස්පත්තුව, දුම්බර, හේවාහැට, කොත්මලේ, උඩබුලත්ගම, පාන බුලත්ගම. ★ <u>දිසාවන් :</u> හතර කෝරළය, හත් කෝරළය, ඌව, සබරගමුව, මාතලේ, වලපනේ, ආදි දිසාවන් 12 දැක්වීම. රට පාලන ඒකකය භාර නිලධාරීන් ලෙස රටේ මහත්තුරු, ඒ යටතේ ලියන රාල, උණ්ඩිය රාල වැනි නිලධාරීන් / දිසාවන භාර නිලධාරීන් දිසාව ඒ යටතේ කෝරාළවරු අතු කෝරාළවරු මුහන්දිරම් වරු විදානේ වරු දැක්වීමට (කරුණු 2 ට ලකුණු 02, විස්තරයට ලකුණු 03) iv. ● දේශපාලනික නීත්‍යානුකූල උරුමය කුසුමාසන දේවිය විවාහකර ගෙන තහවුරු කර ගැනීම, බුදු දහම වැළඳ ගැනීම, දන්ත ධාතුව මහනුවරට වැඩම කරවීම, පෘතුගීසීන් සමඟ සටන් කිරීම හා ඔවුන් අන්ත පරාජයට පත් කිරීම. ● ආගමික : බුදු දහම නගා සිටුවීමට කටයුතු කිරීම, බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම, ලංකාතිලක, රිදී විහාර, ගඩලාදෙණිය විහාර අළුත් වැඩියා කිරීම. ● ආර්ථික : ගොවිතැන දියුණු කිරීම හා කපු වගාව දියුණු කිරීම, උඩරට ආශ්‍රිත වෙඩි ලුණු කර්මාන්තයේ දියුණුවට කටයුතු කිරීම. (ල.06)

(07) i. A. ධර්මපාල රජු B. ෆන් එංගල් බෙක් C. රොබට් බ්‍රවුන්රිග් (ල.03) ii. (1) C (2) G (3) E (4) B (ල.04) iii. දෙවන රාජසිංහ රජු : (1) පෘතුගීසින් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහය දීමට ලන්දේසීන් එකඟ වීම. (2) ලන්දේසීන්ට වැයවන මුදල් වෙළෙඳ ද්‍රව්‍ය (කුරුඳු, ගම්මිරිස්, මී ඉටි ආදී) මඟින් ගෙවීමට රජු එකඟ වීම. (3) ඇතුන් හැර උඩරට සෙසු වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීම පිළිබඳ ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට ලැබීම. (4) පෘතුගීසීන්ගෙන් අල්ලාගන්නා ලද බලකොටු වල රජු අදහස් කරන්නේ නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟවීම. (ල.05) iv. කරුණු : ● ලන්දේසි පාලනයෙන් පීඩාවට පත් පහත රට වැසියෝ තමන් වෙනුවෙන් මැදිහත් වන ලෙස උඩරට රජුගෙන් ඉල්ලා සිටීම. ● ලන්දේසීන්ගේ ආක්‍රමණ හා තර්ජන. ● වසර කීපයක් ඇඳී ගිය යුද්ධ වලින් පීඩා විඳීම. (ල.03) විස්තර කිරීම : ● 1760 ලන්දේසි විරෝධී කැරලි ඇති වීම. ● 1764 ලන්දේසීන්ගේ උඩරට ආක්‍රමණය. ● 1765 දී නැවත ලන්දේසීන්ගේ උඩරට ආක්‍රමණය ආදී තොරතුරු ඇතුළත් කර විස්තර කිරීම. (ල.06)

(08) i. A. ජොහැන්නස් කෙප්ලර් B. ජොහැන්නස් ගුටින්බර්ග් C. බර්තොලමියු ඩයස් (ල.03) ii. A. අලගියරි ඩාන්ටේ B. මයිකල් ආන්ජලෝ C. පෙට්රාක් D. ලියනාඩෝ ඩාවින්චි (ල.04) iii. ● කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත්වීම. ● වෙළඳාමේ දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම. ● බුද්ධි ප්‍රබෝධය. ● පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම. (ආදී කරුණු 02 ක් විස්තර කිරීම.) (ල.05) iv. ක්‍රි.ව. 1453 තුර්කි ජාතීන් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම හා ඔවුන් විසින් වෙළඳ මාර්ග වසා දැමීම නිසා, සාර්ථක වීමට හේතු : ● මාලිමා යන්ත්‍රය සොයා ගැනීම. ● උතුරු තරු මාපකය සොයා ගැනීම. ● ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම. ● ටොලමිගේ ලෝක සිතියම (ආදී කරුණු විස්තර කිරීම.) (ල.06)

(09) i. (1) ක්‍රිස්ටෝපර් කොලොම්බස් (2) ඇමරිගෝ වෙස්පුචි (3) කැබේ සහෝදරයෝ (ල.03) ii. (1) B (2) D (3) C (4) A (ල.04) iii. ● මල භාෂාවක් ලෙස පැවති ලතින් භාෂාව හා ග්‍රීක භාෂා පරි භාවිතයට ගැනීම. ● පුනරුද සමයේ ග්‍රීක ලතින් භාෂාවලින් ලියූ පොත් පරිශීලනය වැඩි වීම. ● විලාසිතාවක් ලෙස මෙම භාෂාව ප්‍රගුණ කිරීම. ● සාහිත්‍යයේ නව ප්‍රබෝධයක් ඇතිවීම. ● නව ගත්කරුවරු හා ඔවුන් විසින් රචිත ග්‍රන්ථ (ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ, ප්‍රැන්සිස් බේකන්, විලියම් ෂේක්ෂ්පියර් වැනි ලේඛකයින්) (ල.05) iv. <u>ආර්ථික :</u> ● යුරෝපයේ අත්ලාන්තික් සාගරය ආශ්‍රිත ස්පාඤ්ඤය, ප්‍රංශය, ඕලන්දය, එංගලන්තය වැනි රටවලට වැදගත් තැනක් ලැබීම නිසා ඔවුන් ලංකාවට පැමිණ ලංකාව සමඟ සෘජු වෙළඳ සබඳතා ආරම්භ කිරීම. ● වෙළඳාම ඉලක්ක කර ගනිමින් ලන්දේසින් කුරුඳු වගා කිරීම, බ්‍රිතාන්‍යයෝ, කෝපි, කොකෝවා, සිංකෝනා, තේ, රබර් වැනි වෙළඳ බෝග වගා කිරීම. ● වාණිජ්‍ය ආර්ථිකයට යොමු වී ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම. ● ලංකාවේ ආනයන අපනයන ආර්ථිකයක් බිහිවීම. ● ආහාර ද්‍රව්‍ය ආනයනය වීම. ● කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වෙළඳ නගර බිහිවීම. ● මුදල් භාවිතය ප්‍රචලිත වීම. ● දුම්රිය මාර්ග හා මහාමාර්ග පද්ධතියක් බිහි වීම. ● කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වෙළඳ නගර බිහි වී නව මධ්‍යම පන්තියක් බිහි වීම. (ල.06) <u>සාමාජීය :</u> ● මුද්‍රණ කර්මාන්තය හඳුන්වා දීම මඟින් මුද්‍රණ කර්මාන්තයේ දියුණුවක් ඇති වීම. ● ඒ හේතුවෙන් පුවත්පත්, සඟරා, පොත් පත් ප්‍රකාශයට පත් වීම. ● එම හේතුවෙන් සමාජයේ දැනුවත් භාවය ඉහළ යාම. ● ලාංකිකයන් යුරෝපා රටවලට ගොස් අධ්‍යාපනය ලැබීම. ● එම නිසා බටහිර චින්තනය මෙරටට ලැබීම. ● විවිධ යුරෝපීය ආගම් ප්‍රචලිත කිරීම, පෘතුගීසි රෝමානු කතෝලික ආගම, ලන්දේසීන් රෙපරමාදු ආගම ● බටහිර අධ්‍යාපන ක්‍රමය ප්‍රචලිත වීම. ● යුරෝපියන් දේවස්ථාන හා ගොඩනැගිලි ඉදිකිරීමෙන් යුරෝපයේ වාස්තු විද්‍යාව ලැබීම.

(01) (අ) (i)

